**බලපිටිය ප්‍රාදේශීය සභාව - 2023**

**----------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

බලපිටිය ප්‍රාදේශීය සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ගිණුම, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172(1) උප වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක් වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට බලපිටිය ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාශර්වයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකි වන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | දුන් වට්ටම් රු.916,175 ක් ආදායම් වියදම් ගිණුමට මාරු කළයුතු වුවත්, රු.850,468 ක් පමණක් වියදම ලෙස මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කරන බව. | නිවැරදිව ගිණුම් ගත කළ යුතුය. |
| (ආ) | වර්ෂය තුළ ලබා දුන් සේවක ණය රු.503,657 ක් ණය ප්‍රාග්ධන ගිණුමට හර කර තිබුණි. | -එම- | -එම- |
| (ඇ) | 2022 වර්ෂයේ දී ප්‍රාග්ධනිත නොකල රු.157,386 ක ස්ථාවර වත්කම් 2023 වර්ෂයේ දී ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායක වීමේ ගිණුම බැර නොකර, ප්‍රාග්ධන වත්කම් අළුත්වැඩියා හා නඩත්තු වියදම් ගිණුමට බැර කර තිබුණි. | -එම- | -එම- |
| (ඈ) | ස්ථාවර වත්කම් අත්පත් කර ගැනීම් රු.499,645 ක් ස්ථාවර වත්කම් යටතේ ප්‍රාග්ධනිත කර නොතිබුණි. | -එම- | -එම- |
| (ඉ) | ආයුර්වේද තොග පරිභෝජනය ආරම්භක තොගය රු.1,060,983 ක් සැපයුම් හා උපකරණ ගිණුමට මාරු කළයුතු වුවත්, ඉන් රු.300,000 ක් පමණක් එම ගිණුමට මාරු කර, ඉතිරි රු.760,983 ක තොගය ආධාර මුදල් දායක මුදල් හා සහනාධාර ගිණුමට හර කර තිබුණි. | -එම- | -එම- |
| (ඊ) | ඉකුත් වර්ෂ සඳහා වන රු.13,487,919 ක මුද්දර ගාස්තු හා උසාවි දඩ රු.216,600 ක් අධිකතා ඌණතා ගිණුමට ගැලපීම් කළයුතු වුවත්, වර්ෂයේ ආදායමට බැර කර තිබුණි. | -එම- | -එම- |

| | | | |
|---|---|---|---|
| (උ) | කර්මාන්ත 03 කට අදාළව ගෙවිය යුතු රු.3,062,700 ක් සඳහා හා ගෙවිය යුතු වියදම්වලට අදාළව රු.486,835 ක් සඳහා ණයහිමි ප්‍රතිපාදන සලසා නොතිබුණි. | -එම- | -එම- |
| (ඌ) | පොල්අතුපලාත 1 වන හරස් පාර සකස් කිරීමට අදාළ ගෙවිය යුතු රඳවුම් මුදල රු.149,913 ක් වුවද, රු.14,999 ක් ලෙස ප්‍රාග්ධන වැය ණයහිමි යටතේ ගිණුම් ගතකර තිබුණි. | -එම- | -එම- |
| (එ) | සමාලෝචිත වර්ෂයේදී කර්මාන්ත 03 කට අදාළව ලැබී, ණයගැතියන්ට ගලපන ලද රු.689,417 ක් නැවත වරක් වැඩියෙන් වෙන් කිරීම් ලෙස ණයගැති ගිණුමෙන් ඉවත් කර තිබුණි. | 2024 අවසාන ගිණුම තුළින් නිවැරදි කිරීමට කටයුතු කරන බව. | නිවැරදිව ගිණුම් ගත කළ යුතුය. |
| (ඒ) | සමාලෝචිත වර්ෂයේ අවසානයට ස්ථාවර වත්කම් වල වටිනාකම වූ රු.367,765,043 ක ශේෂය ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායක වීමේ හා ආධාර මගින් දායක වීමේ ගිණුම් වලට සමාන වියයුතු වුවත්, එම ගිණුම් දෙකෙහි ශේෂය රු.210,055,058 ක් වීමෙන් රු.157,709,985 ක වෙනසක් පැවතුණි. | ඉඩම් හා ගොඩනැගිලි වෙළඳපොල අගයන්ට තක්සේරු කිරීම හේතු කොටගෙන ඇති වූ ප්‍රත්‍යාගණන සංචිත වටිනාකම බව. | නිවැරදිව ගිණුම් ගත කළ යුතුය. |

### 1.6.2 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් විෂයයන් 15 කට අදාළ ශේෂයන් සහ ඒවාට අදාළ උපලේඛනවල දැක්වෙන ශේෂයන් අතර රු.28,655,403 ක වෙනසක් පැවතිණි. | ඉදිරියේ දී නිවැරදි කරන බව. | වෙනස්කම් සසඳා නිවැරදි කිරීමට කටයුතු කළ යුතු වේ. |

### 1.6.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.183,805,688 ක් වූ ගිණුම් විෂයයන් 06 ක් සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය. | වටිනාකම් ප්‍රත්‍යාගණනය කර මෙම උපලේඛන නිවැරදි කරන බව. | ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතු වේ. |

### 1.7 අනුකූල නොවීම්

#### 1.7.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු පළාත් සභාව හා පළාත් පාලන අමාත්‍යාංශ ලේකම්ගේ 2022 දෙසැම්බර් 15 දිනැති පළාත් පාලන චක්‍රලේඛ 2022/01 | පළාත් පාලන ආයතන සපයන සේවා සඳහා තොරතුරු තාක්ෂණික විසඳුම් ලබා දීම සඳහා වෙබ් අඩවියක් නිර්මාණය කර නොතිබුණි. | අවශ්‍ය කටයුතු සඳහා ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය සමග කටයුතු කරමින් පවතින බව. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | 2016 දෙසැම්බර් 29 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 30/2016 | සභාව සතු වාහන 05 කට අදාළව ඉන්ධන පරීක්ෂාව සිදුකර නොතිබුණි. | ඉන්ධන පරීක්ෂාව සිදු කරමින් පවතින බව. | -එම- |

#### 1.7.2 අධිකාරී බලය නොලත් ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ලේකම්වරයා විසින් දිනකට නිවස හා කාර්යාලය අතර ගමන් වාර 04 ක් ගමන් කිරීම සඳහා කණ්ඩායම් ප්‍රවාහන පහසුකම් රහිතව සභාවේ වාහනය භාවිතා කර තිබුණු අතර, ඉන්ධන වෙනුවෙන් රු.107,695 ක් ගෙවීම් කර තිබුණි. | පළාත් පාලන ආයතනයේ සභිකයන්ගේ ධූර කාලය අවසන් වීමත් සමඟ තවදුරටත් එම රාජකාරි ක්ෂේත්‍රය පුළුල් වී ඇති බව. | පිරිවැය අවම වන පරිදි කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.12,106,511 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.14,183,781 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

| ආදායම් ප්‍රභවය | 2023 ඇස්තමේන්තුගත ආදායම | 2023 බිල් කළ ආදායම | 2023 රැස් කළ ආදායම | 2023 දෙසැම්බර් 31 දිනට හිඟය | 2022 ඇස්තමේන්තුගත ආදායම | 2022 බිල් කළ ආදායම | 2022 රැස් කළ ආදායම | 2022 දෙසැම්බර් 31 දිනට හිඟය |
|---|---|---|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 22,815,000 | 22,037,958 | 19,183,711 | 34,205,492 | 13,360,000 | 18,093,709 | 13,462,321 | 31,351,245 |
| කුලී | 5,130,000 | 6,114,336 | 4,368,920 | 4,250,733 | 3,320,000 | 5,194,295 | 4,248,992 | 2,505,317 |
| බලපත්‍ර ගාස්තු | 2,810,000 | 4,063,042 | 4,077,992 | - | 6,015,000 | 2,956,712 | 2,947,962 | 14,950 |
| වෙනත් ආදායම් | 24,550,000 | 21,794,575 | 21,794,575 | - | 7,947,000 | 7,980,366 | 7,980,366 | - |
| | 55,305,000 | 54,009,911 | 49,425,198 | 38,456,225 | 30,642,000 | 34,225,082 | 28,639,641 | 33,871,512 |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ ජනවාරි 01 දිනට අයවිය යුතු වූ ආදායම රු.33,871,512 ක් විය. වර්ෂය තුළ බිල් කිරීම් රු.54,009,911 ක් සමග රැස් කළයුතු සමස්ථ ආදායම රු.87,881,423 ක් වුවද, වර්ෂය තුල රැස් කර තිබුනේ රු.49,425,198 ක් පමණි. | නීතිමය ක්‍රියාමාර්ග ගෙන ඇති බව. | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | කොස්ගොඩ උප කාර්යාල බල ප්‍රදේශයේ වරිපනම් බදු අය නොකරන දියුණු ගම් ප්‍රදේශ 23 ක් 2012 වර්ෂයේ දී ගැසට් පත්‍රයක් මඟින් ප්‍රකාශයට පත්කර තිබුණ ද, ප්‍රාදේශීය සභා පනතේ 134 වන වගන්තිය ප්‍රකාරව වරිපනම් බදු පනවා ගැනීමට කටයුතු කර නොතිබුණි. | ප්‍රාදේශීය සභා පනතේ 134 වගන්තිය ප්‍රකාරව කටයුතු කරමින් පවතින බව. | දියුණු ගම් ප්‍රදේශ හඳුනාගෙන වරිපනම් බදු පැනවීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | බලපිටිය බහු කාර්ය ගොඩනැගිල්ලේ කඩ කාමරයක් සී/ස බලපිටිය විවිධ සේවා සමූපකාර සමිතිය මඟින් 2021 වර්ෂයේ සිට බදුගෙන බදුකුලී නොගෙවීම නිසා 2023 වර්ෂය අවසානයට හිඟ කඩ කුලී ශේෂය රු.1,467,000 ක් හා හිඟ අධි ගාස්තු මුදල රු.195,300 ක් වශයෙන් එකතුව රු.1,662,300 ක් හිඟව පැවතුණි. | හිඟ කඩ කුලී නොගෙවීම සම්බන්ධව දිගින් දිගටම දැනුවත් කර ඇති බව. | කාලීනව බදු මුදල් අය කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඈ) | අහුන්ගල්ල පොදු වෙළඳපොල මාළු කඩ කුටි 03 ක් පවතින අතර, එය ටෙන්ඩර් කර ලබාගත් අවස්ථාවේ සිට බදුකරුවන් විසින් බදු මුදල් නොගෙවීම නිසා රු.277,500 ක හිඟ එක්වන් මුදල් ශේෂයක් ද, රු.136,350 ක හිඟ කඩ කුලී ශේෂයක් ද රු.3,800 ක හිඟ දඩ කුලී ශේෂයක් ද වශයෙන් රු.417,650 ක හිඟ ශේෂයක් පැවතුණි. | හිඟ මුදල් අයකර ගැනීම සඳහා නීතිමය පියවර ගැනීමට කටයුතු කරන බව. | කාලීනව බදු මුදල් අය කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඉ) | 2022 වර්ෂයේ රු.195,480 ක ගාස්තු ගෙවන ලද දැන්වීම් පුවරු 14 ක් 2023 වර්ෂයේ දී ප්‍රදර්ශනය කර තිබුණ ද, ඒවායින් ගාස්තු අය කිරීමට සභාව කටයුතු කර නොතිබුණි. | 2023 වර්ෂයේ ප්‍රචාරක දැන්වීම් පුවරු වලින් ගාස්තු අය කිරීම සඳහා ලිපි යොමුකර ඇති බව. | අයවිය යුතු දැන්වීම් පුවරු ගාස්තු අය කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඊ) | පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් ලැබිය යුතුව තිබූ මුද්දර ගාස්තු රු.28,196,819 ක් විය. | ඉදිරියේ දී අය කරන බව. | මුද්දර ගාස්තු හිඟ ආදායම් අය කළ යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 පනතින් පවරා ඇති කාර්යයන් ඉටු කිරීම

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සභා බල ප්‍රදේශයේ රැස්වන කසළ මොන්රෝවියාවත්ත කසළ ව්‍යාපෘතියට බැහැර කිරීම සඳහා 2023 වර්ෂයේ දී රු.517,500 ක වියදමක් දරා තිබුණු අතර, සභා බල ප්‍රදේශයේ කසළ, සභාවට දේපලක් වියයුතු නමුත් කසළ කළමනාකරණය සඳහා දිගුකාලීන වැඩපිළිවෙලක් සකස් කර නොතිබුණි. | භූමියක් හඳුනා ගැනීමෙන් පසු කොම්පෝස්ට් අංගනය සකස් කිරීමේ කටයුතු ආරම්භ කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා බව. | කසළ කළමනාකරණය සඳහා සුදුසු වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කළ යුතුය. |
| (ආ) | කසළ බදු අය කිරීම සඳහා ප්‍රාදේශීය සභා පනතේ 159(2) ප්‍රකාරව අතුරු ව්‍යවස්ථා පනවාගෙන නොතිබුණු අතර, සභා බල ප්‍රදේශය තුළ පවත්නා ආපන ශාලා හා ලැගුම්හල් 83 න් කසළ බදු අය කිරීමට කටයුතු කළ යුතු නමුත් සභාව විසින් ඒ සඳහා නිශ්චිත ක්‍රමවේදයක් සකස් කර නොතිබුණි. | කසළ බදු අය කිරීමේ කටයුතු සිදු කරමින් පවතින බව. | කසළ ගාස්තු අය කිරීමට අදාළ නිශ්චිත ක්‍රමවේදයක් සකස් කළ යුතුය. |

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ඉඩම් අනුබෙදීමක් සඳහා නාගරික සංවර්ධන අධිකාරියෙන් සහ පළාත් පාලන ආයතනයෙන් පූර්ව ලිඛිත අවසරය ලබා ගතයුතු වුවද, අක්කර 03 රූඩ් 01 පර්චස් 17 ක් වූ කොස්ගොඩ ඌරගහ පාර ඉඩම් කැබලි 37 කින් යුත් ඉඩමෙහි ඉඩම් කට්ටි 04 ක සංවර්ධන කටයුතු අවසරයකින් තොරව සිදු කර තිබුණි. | සමාගම හා ඉඩමේ හිමිකරු සැලසුම් කමිටුවට කැඳවා සාකච්ඡා කොට ඉඩම් අනුබෙදුම් අනුමැතිය සලකා බැලීමට ක්‍රියා කරන බව. | නාගරික සංවර්ධන අධිකාරී නීති රීති ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පරිසර බලපත්‍ර ලබා ගැනීමෙන් තොරව පවත්වාගෙන ගිය කර්මාන්ත ශාලා 09 කින් රු.44,550 ක් සභාවට අහිමි වී තිබූ අතර, ඒ සම්බන්ධයෙන් සභාව කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | සිහිකැඳවීම් ලිපි යවා ඇති බව. | බලපත්‍ර ලබා ගතයුතු කර්මාන්ත පිළිබඳ සමීක්ෂණයක් කර බලපත්‍ර නිකුත් කළ යුතුය. |
| (ආ) | බල ප්‍රදේශයේ පැවති ආපනශාලා හා ලැගුම්හල් 83 ක් සම්බන්ධයෙන් සමීක්ෂණයක් පවත්වා පරිසර බලපත්‍ර ලබා දීමට සහ ඒ මගින් පරිසරයට වන හානිය පිළිබඳ සභාවේ අවධානය යොමු වී නොතිබුණි. | මේ සම්බන්ධයෙන් සමීක්ෂණය දෙවන අදියර ක්‍රියාත්මක කිරීමට කටයුතු යොදා ඇති බව. | සමීක්ෂණයක් සිදුකර පාරිසරික පනත ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඇ) | සභා බල ප්‍රදේශය තුළ පවතින වැලිතර සතිපොළ 2020 වර්ෂයේ වසා දමා පැවති අතර, එය 2023 වර්ෂ අවසාන වන විටත් නැවත ආරම්භ කිරීමට කටයුතු කර නොතිබුණි. | වෙළෙඳුන්ගේ නොපැමිණීම මත මෙම පොළ පවත්වා ගෙන යාමට නොහැකි තත්ත්වයක් උදා වී ඇති බව. | පොල ක්‍රියාත්මක කිරීමට සුදුසු වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කළ යුතුය. |

## 3.4 වත්කම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 17(3) වගන්තිය ප්‍රකාරව සියළුම දේපල සභාව විසින් පරිපාලනය කළයුතු වුවද, සභාව සතු ඉඩම් 25 කට වැට මායිම් දැමීමට ද, ඉඩම් 11 ක අයිතිය නිරවුල් කර ගැනීමට ද කටයුතු කර නොතිබුණි. | ප්‍රතිපාදන වෙන්කර ආරක්ෂිත ක්‍රියාමාර්ග ගැනීමට ක්‍රියා කරන බව. | සභාව සතු ඉඩම් වල ආරක්ෂාව තහවුරු කර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | සභාව සතු රු.28,788,300 ක් වටිනා ඉඩම් 14 ක් හා වටිනාකම හඳුනා ගත නොහැකි ඉඩම් 09 ක් භාවිතයකින් තොරව නිශ්කාර්යව පැවතුණි. | ඉඩම් ඵලදායී අයුරින් උපයෝජනය කිරීමට ක්‍රියා කරන බව. | ඉඩම් ඵලදායීව ප්‍රයෝජනයට ගත යුතුය. |
| (ඇ) | ප්‍රාදේශීය සභාව සතු අක්කර 01 රූඩ් 02 පර්චස් 32.753 ක් වූ ඉඩම් 04 ක් හා ප්‍රමාණය දක්වා නොමැති ඉඩම් 02 ක් සභාව නමින් පවරා ගෙන අයිතිය නිරවුල් කර ගැනීමට සභාව කටයුතු කර නොතිබුණි. | ඉඩම් පවරා ගැනීම සඳහා පැවරුම් නියෝග ඉල්ලා ඇති බව. | ඉඩම් වල අයිතිය නිරවුල් කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) | සභාව සතු ප්‍රමාණය දක්වා නොමැති ඉඩම් 04 ක හා අක්කර 08 රූඩ් 02 පර්චස් 01 ක් වූ ඉඩම් 20 ක වටිනාකම වෘත්තීය තක්සේරුකරුවකු ලවා තක්සේරු කර ස්ථාවර වත්කම් ලේඛනයට ඇතුළත් කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ඉඩම් කැබලි වලට අදාළ පිඹුරුපත් සකස් කර තක්සේරු දෙපාර්තමේන්තුව වෙත යවා නව තක්සේරු වටිනාකම් ලබාගෙන ස්ථාවර වත්කම් ලේඛනයට ඇතුළත් කරන බව. | වටිනාකම තක්සේරු කරවාගෙන ලේඛන ගත කළ යුතුය. |
| (ඉ) | දකුණු පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයෙන් 2005 වර්ෂයේ ලැබී තිබුණු වටිනාකම රු.1,000,000 ක් වූ ට්‍රැක්ටරය සභාව නමින් ලියාපදිංචි කර නොතිබුණි. | ලියාපදිංචිය පවරා ගැනීමට අවශ්‍ය කටයුතු මේ වනවිට සිදු කරමින් පවතින බව. | අයිතිය පවරා ගැනීමට කටයුතු කළ යුතුය. |

**3.5 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | **හැගල්ල ක්‍රීඩාපිටිය සංවධර්නය කිරීම** | | |
| (අ) | වැඩ විෂය 1 යටතේ ක්‍රීඩාංගනයේ පැවති පස් කැපීම සඳහා පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය විසින් මිනිස් ශ්‍රමයෙන් පස් කැපීම සඳහා හඳුන්වා දී තිබුණු E1 – 001 ඝණ මීටරයකට රු.840 ක මිල අනුපාතය භාවිතා කර, ඝන මීටර් 850 ක් පස් කැපීම සඳහා රු.714,000 ක් ගෙවීම් කර තිබුණ ද, පස් කියුබ් 300 ක් තරම් ප්‍රමාණයක් කැපීම සඳහා නියෝජ්‍ය ප්‍රධාන ලේකම් ඉංජිනේරු සේවා කාර්යාලය විසින් ඝණ මීටරයකට යන්ත්‍ර භාවිතා කර කැපීම් කර, මීටර් 100 ක් තරම් දුර රැගෙන යාම සඳහා හඳුන්වා දී තිබුණු EW – 10 ඝණ මීටරයකට රු.126 ක මිල අනුපාතය භාවිතා නොකිරීම නිසා ඝණ මීටර 850 ක් සඳහා රු.606,900 ක් (850 X 714) වැඩිපුර ගෙවා තිබුණි. | පස් තට්ටුව යන්ත්‍ර මඟින් ඉවත් කිරීමට පැවති භෞතික තත්ත්වය මත සිදු කිරීමට නොහැකි බව. | අනුමත රේටයන් භාවිතා කළ යුතුය. |
| (ආ) | වැඩ විෂය 4, 9 සහ 23 යටතේ අත්තිවාරම් කැපීම සඳහා නියෝජ්‍ය ප්‍රධාන ලේකම් ඉංජිනේරු කාර්යාලයේ EW – 02 මිල අනුපාතය යටතේ මිනිස් | මිනිස් ශ්‍රමයෙන් පස් කැපීම සිදු කරන ලද බව. | -එම- |

| | | | |
|---|---|---|---|
| | ශ්‍රමයෙන් පස් කැපීම සඳහා හඳුන්වා දී තිබුණු මිල අනුපාතය යටතේ ඝණ මීටර් 41.525 ක් සඳහා ගෙවීම් කර තිබුණ ද, මේ සඳහා EW – 10 d යටතේ යන්ත්‍ර මඟින් අත්තිවාරම් කැපීම සඳහා හඳුන්වා දී තිබුණු රු.483 ක මිල අනුපාතය භාවිතා නොකිරීම නිසා රු.34,325 ක් වැඩිපුර ගෙවා තිබුණි. | | |
| (ඇ) | වැඩ විෂය 25 හා 26 යටතේ පැති බැම්ම ඉදිකිරීමේ දී කොන්ක්‍රීට් සඳහා පළාත් මාර්ග සංවර්ධන අධිකාරියේ මිල ගණන් භාවිතා නොකර, නියෝජ්‍ය ප්‍රධාන ලේකම් ඉංජිනේරු කාර්යාලය විසින් හඳුන්වා දී තිබුණු මිල ගණන් භාවිතා කිරීම නිසා රු.39,731 ක් වැඩිපුර ගෙවා තිබුණි. | මෙය මාර්ග සංවර්ධනයක් නොව පැති බැම්මක් ඉදිකිරීම බව. | -එම- |

**3.6 මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සේවයෙන් ඉවත් වූ හා මිය ගිය නිලධාරීන් 03 දෙනෙකුගෙන් අයවිය යුතු රු.61,035 ක ණය ශේෂය සඳහා නිලධාරීන් දැනුවත් කර තිබුණ ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ xxiv වැනි පරිච්ඡේදයේ 12.10 වගන්තිය ප්‍රකාරව කළමනාකරණය කටයුතු කර නොතිබුණි. | ණය ශේෂ නිරවුල් කර ගැනීම සඳහා අවශ්‍යා ඉදිරි කටයුතු සිදු කමින් පවතින බව. | අයවිය යුතු සේවක ණය ශේෂ අයකර ගත යුතුය. |